## 49

# සීගිරි ගීයේ ස්ත්‍රී-පුරුෂ අසම්මතය හා බැඳුණු මනෝ විවරණය

*වරුණි වත්සලා, පී. ඩබ්.*[1]

සිංහල සාහිත්‍යයේ සුවිශේෂ යුගයක් ලෙස අනුරාධපුර යුගය වැදගත් ය. මෙකල සාහිත්‍යය, ගද්‍යය හා පද්‍යය වශයෙන් ද්විඛණ්ඩනයකට ලක් කොට හඳුනා ගත හැකි ය. ඒ අතර පද්‍ය සාහිත්‍යයේ අනුස්මරණීය නිර්මාණයක් වන්නේ සීගිරි පද්‍යයයි. සීගිරි ගී නිර්මාණ බොහොමයක් දේශීය සම්ප්‍රදායානුගත නිර්මාණ වන අතර ඒවායේ විශේෂිත වූ අලංකාර, කාව්‍ය උපක්‍රම පැවතිණ. සීගිරි ගී රචකයෝ ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි නානාවිධ අදහස් මනෝභාවයන් සහිත වූවෝ ය. ඔවුන් අතර සාමාන්‍ය ගැමියන් මෙන් ම විදග්ධ පුද්ගලයෝ ද වූහ. මේ හේතුවෙන් සීගිරි ගීයේ රසයන් කුළුගැන්වීම ද එකිනෙකට වෙනස් ස්වභාවයක් උසුලයි. ඇතැම් ගීවල මනා කාව්‍යාත්මක ගුණයන් ඉස්මතු වන සෙයකි. සීගිරි කවීන්ගේ ස්ත්‍රී-පුරුෂ අසම්මතය හා බැඳුණු මනස විවරණය කොට දැක්වීම මෙහි පර්යේෂණ ගැටලුවයි. ප්‍රිය-ප්‍රියාවන්ගේ ප්‍රේමය උදෙසා හේතු වන සිතෙහි ගති ස්වාභාවයන් මෙන් ම එකල නිරූපිත සමාජ සත්තාවන් ද සීගිරි කවීන් වස්තු විෂය සේ යොදා ගත් අයුරු අධ්‍යයනය කිරීම මින් අපේක්ෂිත ය. සීගිරි ගී ඔස්සේ බොහෝ පර්යේෂණ කෘති ප්‍රකාශයට පත් වුව ද සම්මතය ඉක්මවා ගිය බැඳීම් තුළ පුද්ගල මනස පිළිබඳ කෙරී ඇති විවරණයක් හඳුනා ගැනීම අසීරු ය. එබැවින් මෙම පර්යේෂණය මඟින් එකල පැවති සමාජයේ පුද්ගල චෛතසික ස්වභාවයත් ඔවුනොවුන්ගේ ආධ්‍යාත්මික සමෝධානයන්ගේ පෘථුලතාව පිළිබඳවත් විමර්ශනයක යෙදිය හැකි ය. පුද්ගල සන්තානගත ව ඇති වන්නා වූ රාගය, ප්‍රේමය, වේදනාව ආදි මනෝභාවයන් කුළු ගැන්වීමේ දී සීගිරි කවියෝ සංයමය සුරැකියෝ ය. 344 ගීයෙන් ප්‍රකාශ වන්නේ ස්ත්‍රී චපලත්වයයි. තම රාගී චේතනාව දැල් වූ ඇය ඔහු ඉදිරියේ ම තවෙකෙකුට ප්‍රේම කරන්නී ය. ඒ අතර ඇයගේ අනුග්‍රහය සඳහා තෙවැන්නෙකුගේ පැමිණීම ඔහුගේ පුදුමයට හේතුවකි. මෙම සංකීර්ණමය ක්‍රියාවලිය කවියා ඉදිරිපත් කොට ඇත්තේ කෝපය, තරහව, වෛරය, වේදනාව දැනවෙන අයුරින් නොව මනා සංයත බවකින් යුක්තව ය. මෙහි දී පුද්ගල සිත්හි ඇති වන්නා වූ හැඟීම් සමුදායන්හි ගුප්ත ස්වරූපයත්, පොදු සමාජ චපලත්වයත් නිරූපිත ය. සීගිරි ගී කවියෝ භාෂා සාහිත්‍යයේ පරිචිත වූවෝ ය. සීගිරිය නැරඹීමේ දී සිත්වලට ගලා ආ මනෝභාවයන් විවිධ කාව්‍ය ශිල්ප ක්‍රම ඔස්සේ පිඬු කොට දක්වමින් පාඨකයා හට අසම්මතයෙන් සම්මතය කරා පැමිණෙන්නැ'යි ආරාධනා කරන සෙයකි. මේ අනුව සීගිරි කවීන් ස්ත්‍රී-පුරුෂ අසම්මත බැඳියාවන් තුළින් සමාජ මිදවීමක් අපේක්ෂා කළ බැව් සනාථ කිරීම මෙම විමර්ශනයේ අරමුණයි.

ප්‍රමුඛ පදඃ සීගිරි ගී, මනෝභාවයන්, සංයමය, පෘථුලතාව, ආධ්‍යාත්මික සමෝධානයන්

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*